සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

"සිය බසේ සම්මත වියරන රීති ගැන කතා කිරීමෙන් පලක් වේ ද" යන ප්‍රශ්නය ඇසීමට මට ම සිදු වී ඇත.

පුවත් පත්වල පල වන සමහර "කය් - ගැදි කය් - ලිපි " කියවන විටත් රූපවාහිනයේ /ශබ්ද වාහිනියේ "ප්‍රවුර්ති - දැන්වීම් - ගීත " අසා සිටින විටත් ය, මට ඒ සිතිවිලි පහල වන්නේ. මේ ලියන මොහොතේ සිරි ලංකාවේ "සිටිඑෆ්එම් (ඍඑහ තඑ) " සේවයෙන් ඇසෙන සින්දුව / ගීතය ගැන ලියන මම ලිපියට මුල පුරමි.

"සුරා පොදක් මා තොල ගෑ පමනින් සුරා සොඬකු වේදේ ඇය අත ගෙන රැඟුමක් පෑ පමනින් මා සලෙලකු වේදේ" වාක්‍යයක් යනු උක්තයක් සහ ආක්‍යාතයක් සහිත ලියවිල්ලකි. සමහර වැකියක උක්තය හෝ අක්‍යාතය අපේ අතින් යෙදීමට සිදුවේ.

"නෑව:ද? - කෑව:ද?" යන ප්‍රශ්නයේ උක්තයත් "මම ගායකයෙක් - ඌ මහ මෝඩයෙක්" යන වැකි වල ආක්‍යාතයත් අතින් යොදා වාක්‍යය සම්පූර්න කිරීමට අපට සිදු වේ. "ඔබ / උඹ කෑව:ද? නෑව:ද?" යනුවෙන් මුල් වැකියත්, "මම ගායකයෙක් වෙමි, ඌ

මහ මෝඩයෙක් (මෝඩයෙකි) වේ" යනුවෙන් දෙවන වැකකි දෙකත් සම්පූර්න කල හැකිය.

ඉහත සින්දුවේ ඇති වැකකි දෙක "සුරා පොදක් මා තොල ගෑ පමනින් මම් / මම සුරා සොඬක් වේම් (ඳ) දේ ? ඇය (ගැහැන-ියකගේ) අත ගෙන රැඟුමක් පෑ පමනින් මම් /මම සලෙලෙක් වෙම් (ද) දේ " යනුවෙන් නිවැරදි කල හැකිය.

ඇත්තමට එය කල යුතු ද ? මේ වැකි දෙකේ අදහස තේරුම් ගැනීමට ඇති බාදාව කුමක්ද ? පාරේ රතයක් පදවන පදුවාට පාරේ නීති අනුයෑමට සිදුවේ. අනුන්ට (අනෙක් වාහනවලට) බාදා නොවීම සඳහා පාරේ නීති පිලිපැදිය යුතුය. පාරක යන විට ටැට්ටැරියට උවත් පාරේ නීති පිලිපැදීමට සිදුවේ. කුඹුරක හෝ ඉඩමක වැඩ කරන ටැට්ටැරියට පාරේ නීති උවමනා නැත.

නැවකට හෝ ගුවන් යානයකට පාරේ නීති බලපාන්නේ නැත. අපි දෙඩන බාසාව ගැන කෙටි විමසීමක් කරමු.

"මම / මං අඹ කඩනව: / කැඩුව:
අපි අඹ කඩනව: / කැඩුව:(4)
ඔහේ / උඹ /ඔබ අඹ කඩනව: (ද?)/කැඩුව: (ද?)
ඔහේල / බොලා /ඔබ අඹ කඩනව: (ද?)/කැඩුව: (ද?)(4)
ඒක: / ඌ /එයා/එහේ අඹ කඩනව: /කැඩුව
උං / එයාල: අඹ කඩනව: /කැඩුව (4)
ඈ / එකී අඹ කඩනව: /කැඩුව
උං / එයාල:/ඒකිල: අඹ කඩනව: /කැඩුව (4)
ඒක/අඹය ගඟේ පාවෙනව: /පා උන:
ඒව: / අඹ ගඟේ පාවෙනව: /පා උන: (4)

මේ වාක්‍ය 20 තේරුම් ගැනීමට බාදාවක් ඔබට ඇති උනා ද? කතා බහේ දී විවෘත "ආ" යන්න "අ" වන බව ඔබ දනිති.

"සීය නාල බුලත් කාල කොන්ඩෙ බැඳල සරම ඇඳල ආව් අප්ප මොන ශෝක් ද ?"
"සිය: නාල: බුලත් කාල: කොන්ඩෙ බැඳල: සරම ඇඳල: ආව් අප්ප: මොන ශෝක් ද ?"
"සීයා නාලා බුලත් කාලා කොන්ඩෙ බැඳලා සරම ඇඳලා ආව් අප්පා මොන ශෝක් ද ?" යන වාක්‍ය තුන කියවන ඔබට මා : ලකුන යොදන්නේ ඇය් දැය් තේරුම් ගත හැකිය.

සීයා / සීය:/සීය , කාලා / කාල: /කාල, නාලා/නාල:/නාල යන තැන්වල වෙනස ඔබට පෙනෙනු ඇත.

"මෝරා බලයා ගිලී - බලයා මෝරා ගිලී"

මෙහි දෙවැනි වැකිය වැරදි ලෙස අප දකින්නේ බලයකුට මෝරකු ගිලිය නොහැකි නිසාය. එහෙත් මෝරා ගැනත් බලයා ගැනත් නොදන්නා පොඩිත්තකුට එය නොපෙනේ.

වැද්දා කොටියා මරය් / කොටියා වැද්දා මරය්
මිනිසා කිඹුලා මරය් / කිඹුලා මිනිසා මරය්

මේ වැකි හතර ගැන ඔබ කියන්නේ කුමක්ද ? මා දන්නා හැටියට මේ වැකි 4 ම නිවැරදිය.

වැද්දෙක් කොටියෙක් මරය් / කොටියෙක් වැද්දෙක් මරය්
මිනිසෙක් කිඹුලෙක් මරය් / කිඹුලෙක් මිනිසෙක් මරය්

මේ වැකි 4 වැරදි ලෙස අප දකින්නේ "අකු" ප්‍රත්‍යය තිබිය යුතු තැන්වලත් "එක්" ප්‍රත්‍යය යොදා ඇති නිසා මිස තේරුම් ගැනීමට ඇති බාදාවක් නිසා නොවේ. කවියක හෝ ගීයක විරිත රැකීම සඳහා හෝ එලිවැට රැකීම සඳහා අපි
"වැද්දා මරය් කොටියා / කොටියා මරය් වැද්දා
මිනිසා මරය් කිඹුලා / කිඹුලා මරය් මිනිහා " යන වැකි ලියමු. වැකි 4 ම නිවැරදි බව ඇත්තයි. එහෙත් මැරූ එකා මොකාද, මැරුනු එකා මොකාද යන්න තේරුම් ගැනීම දුශ්කරය.

මා දහ වැනි ශ්‍රේනියේ ඉගෙන ගනිද්දී මා සිතා සිටියේ "වැද්දන් කොටියා මරය් - මිනිසුන් කිඹුලා මරය්" වැනි වැකි නිවැරදි යැ කියාය්. වැද්දේ සිහ මිනිස්සු උක්ත රූප නිසා අක්‍යාතය බහු

සුභාෂිතයෙන්

වි ක ධර්මබන්ධු

ලොවින් එකෙක් එක් දෙයකට වෙය් සමත
එය්න් අනෙක් දෙයකට අනෙකෙක් සමත
නොමින් සුලඟ ලදුවත් තද හිමි සැපත
ගොඩින් නැව දියෙන් රතය ද නොයනු යුත

ගැදි කවිය :
ලොවින් එකෙක්
එක් දෙයකට සමත වෙය්
අනෙකෙක්
එය්න් අනෙක් දෙයකට
සමත වෙය්
නොමින් සුලඟ ලදුවත්
තද හිමි සැපත
ගොඩින් නැව (ත්)
දියෙන් රතය ත් නොයනු යුත

තේරුම : ලෝ වැසියන්ගෙන් එක් කෙනෙක් එක් දෙයක් (වැඩක්) කිරීමට සමත් වේ. වෙනත් කෙනෙක් අනෙක් දෙයක් කිරීමට සමත් වේ. බොහෝ සේ සුලඟ හැමුවත් තද ග්‍රීස්මය තිබුනත් නැවක් ගොඩින් යන්නේ වත්, රතයක් දියෙන් යන්නේවත් නැත.

පැහැදීම : "ලොවින් එකෙක් එක් දෙයකට සමත වෙය්" යනු කොතරම් බොලඳ සදෙස් කියමනක් ද යන්න ඔබට තේරුම් ගත හැකිය. ගායනය වාදනය රංගනය යන තුනටම හපන් අය ගැනත්, ගනිතය විද්‍යාව නීතිය යන තුනටම හපන් අය ගැනත්, වෙදකම නලුකම සිත්තම (චිත්‍ර කර්මය) යන තුනටම හපන් අය ගැනත් අපි අසා ඇත්තෙමු; ඔවින් ගේ හපන්කම් දැක ඇත්තෙමු. මෙබඳු කියමන්වලින් කිවින්දාගේ දැනුමේ දිග පලල එලි දරව් වේ. විශයයන් සියල්ල ම ඉතා ඉහලින් සමත් වූ සිසු දරුවන් ගැන ඔබත් අසා ඇත.

එදා නැව් ගමන් කලේ සුලඟින් බව සැබවි. සුලං නැති විට මිනිස් දෑතේ බලයෙන් - හබලේ බලයෙන් නැව් පැදවේ. අද නම් සුලඟ නැති වීම නැවේ ගමනට උදව්වකි. එදා මොටෝ රත තිබුනේ නැත. අශ්ව රත ගැන පත පොතේ සඳහන් වෙතත් (සාමාන්‍ය) ගමේ ගොඩේ ඇත්තන් ගමන් බිමන් ගියේ ගැලෙන් හෙවත් කරත්තයෙනි; හෙවත් "ගොන් රියෙනි".

මෑත යුගයේ බාවිතයේ පැවති බග්ගිය / බක්කි කරත්තය අපේ වාහනයක් නොවිය හැකිය. එහි නම පවා අපේ නොවේ. ගොනුන් දෙදෙනකු යෙදූ බර කරත්ත ගැන වත් පතක පොතක සඳහන් වී ඇති තැනක් මා දැක නැත.

"දඬු මොනර යානය" ගැන කතා බහ කරමින් අපි දපෙමු; පිපෙමු. ගුවන් යානය නිපද වූ රය්ට් ලා මොන .....ද ? අපි නොවැ ..... ගොඩින් සහ දියෙන් යන වාහන ගැනත්, දියෙන් සහ අහසින් යන වාහන ගැනත් අද අපට අසන්නට ලැබේ. අනාගතයේදී ගොඩින් දියෙන් සහ අහසින් යන වාහන ගැන අසන්නට නොලැබේතැය් කාට නම් කිව හැකිද ? මේ කිවින්දා "තද ගිමි සැපත" යනුවෙන් කියන්නේ කුමක් දැය් සිති ගත නොහැකිය. ඔරුවේ ගමනට සුලඟ උවමනා වෙතත් රතයේ (ගැලේ / කරත්තයේ) ගමනට ග්‍රීස්මය උවමනා වන බවක් මම නොදනිමි.

පොලොව වටා ඉරු ගමන් කල යුගයේ ලියන ලද මෙබඳු කියමන් බරට ගනන් ගත යුතු නැත

33 වන පිටෙන්

ක්‍රමවලින් නිර්වාණාවබෝධය ලබා ගන්නා ආකාරය මැනවින් විස්තර කළහ. අත්තකිලමතානුයෝගය ශරීරයට වුවමනාවට වඩා දුක් දීම කාමසුඛල්ලිකානු යෝගය - ශරීරයට වුවමනා-වට වඩා සැපදීම අත්හැර මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන ලෙස දේශනා කළහ.

පටිච්ච සමුප්පන්න ධර්මයන් යථා ස්වරූපයෙන් දැන හඳුනා අවබෝධ කර ගැනීම භව චක්‍රයේ සිඳ දැමීම සඳහා හේතු වේ. තණ්හාව සංසාර චක්‍රයේ ප්‍රධාන අංගයක් හෙයින් එය යථා ස්වභාවයෙන් අවබෝධ කර ගැනීම භව චක්‍රය සිඳ දැමීමකි. (ධර්මචක්‍ර පදනම - පූජ්‍ය බෝදගම චන්දිම හිමි) මෙයින් මහත් සේ සතුටට පත් පඤ්ච වග්ගිය භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දේශනාවට ප්‍රීතිය ප්‍රකාශ කළහ.

මේ අර්ථ, ධර්ම, නිරුක්ති ප්‍රතිභාන සංඛ්‍යාත වෛය්‍යාකරණ ධර්මය වදාළ කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ මහා තෙරුන් වහන්සේට රජස් සහිත වූ කෙළෙස් මළ රහිත දහම් ඇස සෝවාන් මාර්ගය ඥාණය හා ඵලය පහළවිය. යම් කිසිවක් හට ගන්නා සමුදය ස්වභාවය ඇත්තේ ද ඒ සියල්ල නිරුද්ධ වන ස්වභාවය ඇත්තේය.

මේ ධර්ම චක්‍රය පවත්වන ලද කල්හි භූම්‍යස්ථ (බූමාටු) දෙවියෝ සාධු නාද පැවැත්වූහ. කෙසේ ද යත් භාග්‍යවතුන් වහන්සේ විසින් බාරාණසී පුරයෙහි ඉසිපතන මිගදායෙහි කිසිදු ශ්‍රමණයෙකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් බ්‍රහ්මයෙකු විසින් හෝ ලෝකයෙහි අන් කිසිවකු විසින් හෝ නොපැවැත්විය හැකි වූ නිරුත්තරවූ ධර්මචක්‍රය පවත්වන ලද්දේය. මුළු තුන් ලොව පුරාම ධර්ම චක්‍රය භ්‍රමණය වූයේය. ඉන්පසු රාෂ්ට්‍ර - විරූඪ - විරූපාක්ෂ - වෛශ්‍රවණ ධුත - යන සතර දිශාවට අධිපති සිව් වරම් දෙවි මහරජ දරුවන් වසන චාතුර්මහා රාජික දිව්‍ය ලෝකයෙහි සියළු සම්‍යක් දෘෂ්ටික දෙවි දේවතාවෝද යාම දිව්‍ය ලෝකයෙහි සියළු දෙවියෝද නිම්මාණරතී දිව්‍යලෝකයෙහි සියළු දෙවියෝ ද පරනිර්මිත වසවර්ති දිව්‍ය ලෝකයෙහි සියළු දෙවියෝද බ්‍රහ්ම පාරිසජ්ජ - බ්‍රහ්ම පුරෝහිත පරිත්තාභ - අප්පමාණාභ - ආභස්සර පරිත්ත සුභ අප්පමාණ සුභ සුභ කිණ්ණ - වෙහප්ඵල - අසඤ්ඤ සත්ත අවිහ - අතප්ප - සුදස්ස - සුදස්සි අකුණිට්ඨිත යන බ්‍රහ්ම ලෝකවල සියළු බ්‍රහ්මයෝද සාධු නාද පැවැත්වූහ. ප්‍රීතිය ප්‍රකාශ කළහ.

මේ ආකාරයෙන් ඒ මොහොතේදී දස සහශ්‍රී ලෝක ධාතුවද බොහෝ සෙයින් කම්පා විය. විශේෂයෙන්ම මේ සියළුම දිව්‍ය බ්‍රහ්මයන්ගේ සාධුකාර ශබ්දය ඉතා උස්ව පැන නැග්ගේය. අප්‍රමාණ වූ මහත්වූ මහා ආලෝකයක් මුළු තුන් ලොව සිසාරා පැතිර ගියේය.

මේ ධර්මචක්‍ර සූත්‍ර දේශනාව අවසානයේදී "භාග්‍යවතුන් වහන්සේ" අඤ්ඤාසී වත හො කොණ්ඩඤ්ඤෝ - අඤ්ඤාදී වත හෝ කොණ්ඩඤ්ඤො යනුවෙන් නිරාමිෂ ප්‍රීති වාක්‍යක් ද පැවැත්වූ සේක. කාම - රූප - අරූප යන මුළු තුන් ලෝකයෙහි ප්‍රථම සෝවාන්වූ වූ පුද්ගලයා කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේය. එසේම කමට මුලින් 'අඤ්ඤා' යන් විශේෂ ගෞරව නාමයකින් ද පුදනු ලැබීය. පසු කලෙක අසූ මහා ශ්‍රාවකයන් අතර බොහෝ කල් තොරතුරු දන්නා චිරරාත්‍රඥ භික්ෂූන් අතරෙන් අග්‍රස්ථානය ද ලැබී රත්තඤ්ඤුං යදිදං 'අඤ්ඤා කොණ්ඩඤ්ඤෝ' යන නමින් ප්‍රකට විය. සාධු සාධු සාධු

මෙම ධර්මචක්‍ර සූත්‍ර දේශනාව අදත් ශ්‍රී ලංකාවේ පමණක් නොව ගිහි පැවිදි බෞද්ධයන් සිටින ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ලන්ඩනය, කැනඩාව ඇමෙරිකාව ආදී අපරදිග රටවලද තායිලන්තය, මියන්මාරය, ජපානය චීනය යන රටවල ද නිතර භාවිතා කිරීම සතුටට කරුණකි.

විශේෂයෙන් තිස් පෑ පිරිත් තුන්තිස් පෑ පිරිත් සත් දවසේ පිරිත් සජ්ඣායනා කිරීමේදී තුන්වර බණවරට ඇතුළත් මේ ධර්මචක්‍ර සූත්‍ර දේශනාවේදී 'සද්ද මනුස්සාවෙසුං' යන පදයෙන් අවසන්වන සෑම අවස්ථාවකදීම හේවිසි නාද පැවැත්වීඹ රත්ඤ්ඤ පත්තු කිරීම වැනි නොයෙකුත් ශබ්ද පවත්වා නිදිමත ඇති බෞද්ධයන්ගේ නිදිමත ද දුරු කරවා භික්ෂු මහා සංඝයා වහන්සේ ශබ්ද නගා යට කී දිව්‍ය බ්‍රහ්මයන්ගේ සාධු නාදයද සංකේතවත් කරමින් සිදුකරන මෙම ධර්මචක්‍ර සූත්‍ර දේශනාව කිසියම් ආධ්‍යාත්මික නාට්‍ය ස්වරූපයක් ද ගන්නා බවද පෙනේ.

එසේම මීටම ගැළපෙන අයුරින් ශ්‍රී ලංකාවේ දෙවියන් උදෙසා පවත්වන විශේෂ පුද පූජා පෙරහැර පැවැත්වීම ද ඇසළ පො-හොයට යොදා ගෙන තිබේ. මහ නුවර ඇසළ පෙරහැර සිව් දේවාල පෙරහැර දෙවිනුවර - කතරගම - අලුත් නුවර ආදී දේවාලවල පෙරහැර පැවැත්වීමද අති උත්කර්ෂවත් අන්දමින් සිදු කිරීම මේ කාලයේ සුලභව දැකික හැකිය.

ඊළඟ ශාසනික වශයෙන් වැදගත්වන විසි වයස් සපිරි තුන්